# වෙලාවකට හරි හොඳයි



ජානකී සූරියආරච්චි

álsß m‰ldYlfhda

1490/8, **හෝකන්දර පාර**, **පන්නිපිටිය**.
Tel: 2847438, E-mail: janu@tikiri.com,
Web: www.tikiri.com

# වෙලාවකට හරි හොඳයි



කතාව චිත්‍ර

පරිගණක අක්ෂර සහ වර්ණ සංයෝජනය

**ජානකී සූරියආරච්චි**

ප්‍රථම මුද්‍රණය - 2008

© ජානකී සූරියආරච්චි

ISBN: 978-955-1090-57-9
**Book Ref: T/08/139**

මුද්‍රණය
තරංජී ප්‍රින්ට්ස්
නො. 506, හයිලෙවල් පාර,
නාවින්න, මහරගම. Tel: 2804773

**ස්තූතිය !**

මගේ පොත් වල අඩුපාඩු නොබලුවද නිතරම මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ ආදර අම්මාටත්, මා ඉල්ලන, හැකි සියලු දේ මට ලබාදෙන මගේ ආදර තාත්තාටත්, "හරිම කරදරේ" කියමින් වුවද, මට නිරතුරුවම උදව් කරන (මගේ එකම පොතක් වත් කියවා නැති) මගේ ආදර මල්ලීටත්, මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදර ආච්චීටත්, මට සෙවනැල්ලක් මෙන් සිටින මගේ ආදර ලොකු අම්මාටත්, මගේ කතන්දර කියවා අඩුපාඩු පෙන්වාදෙන මගේ ආදර මිතුරු මිතුරියන්ටත්, භාෂාවේ මා නොදත් දේ මට හොඳින් කියාදුන් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාට හා මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියටත්, කලට වේලාවට මුද්‍රණ කටයුතු නිමකර දුන් පාලිත පෙරේරා මහතාටත්, වචනයකින් හෝ මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හෘදයංගම ස්තූතිය !

**ජානකී සූරියආරච්චි**
1490/8, හෝකන්දර පාර,
පන්නිපිටිය.
Tel: 2847438
01-08-2008

# වෙලාවකට හරි හොඳයි!

චූටි බබාගෙ අම්මා වැඩ ඇරිලා එන්නෙ හවසට. අම්මා එනකල් චූටි බබා බලාගෙන ඉන්නෙ ඉවසිල්ලක් නැතුව. අම්මා එක්ක හුරතල් වෙන්න එයා හරි ආසයි.

අම්මට කියන්න දවසේ විස්තර ගොඩක් තියෙනවා. පෙත්තප්පු ගැන, මාලු ටැංකිය ගැන, උගුරැස්ස ගහට ආ අලුත් කුරැල්ලා ගැන! හුරතල් වෙවී අම්මාට ඒවා කියාගන්නකල් චූටි බබාට ඉන්න බෑ.



ඉතින් එක දවසක් චූටි බබා වෙනදා වගේ
අම්මා එනකල් බලාගෙන හිටියා.
අම්මා ඈත එනකොට එයා දුවලා ගිහින්
අම්මගෙ ඇගේ එල්ලුණා.
"යන්න ළමයො අහකට!" අම්මා සැර කළා.
චූටි බබාගෙ මූණ ඇඹුල් වුණා.



"ඇයි මේ?" එයා ආයෙත් අම්මගෙ ඇගේ එල්ලුණා.
"කරදර නොකර යන්න ළමයෝ." අම්මා ආයෙත් කීවා.
"අම්මා අද හරි වෙනස්!" චූටි බබා දුකෙන් හිතුවා.
ඇස්වලින් කඳුළුත් ආවා.
අම්මා සැර කළ නිසා ලැජ්ජාත් හිතුණා.
"පෙත්තප්පුවත් දැක්කද දන්නෙ නෑ."
චූටි බබාට ලැජ්ජයි, කේන්තියි, දුකයි.



එයා ළඟ තිබුණු මී අඹ ගහ යටට වෙලා කල්පනා කළා.
"අම්මා එක එක වෙලාවට එක එක විධියයි.
වෙලාවකට හරි හොඳයි, වෙලාවකට හරි සැරයි, ඇයි මේ?
ඇයි අම්මට හැම තිස්සෙම එක වගේ හිනා වෙලා
ආදරෙන් ඉන්න බැරි?"
චූටි බබා තනියම හිතුවා.
"මම මෙච්චර වෙලා පාර බලාගෙන හිටියෙ අම්මා එනකල්.
ඒත් අම්මා මට යන්න ළමයො කිව්වා. මිහ් - මිහ් !"
එයාට ඇඬෙන්නත් ආවා.





"පුරු - පුරු - පුරු,"
පූසියා ඇවිත් චූටි බබාගෙ කකුල වටේ දැවටුණා.
"යන්න අහකට!" චූටි බබා පූසියා තල්ලු කරලා දැම්මා.
පූසියා බය වෙලා කෑගහගෙන දිව්වා.
ඊට ටිකකට පස්සෙ බූලාත් චූටි බබාගෙ
ළඟට ඇවිත් සෙල්ලම් පටන්ගත්තා.
"කරදර නොකර යන්නයි කිව්වෙ!"
චූටි බබා බූලාටත් සැර කළා.
බූලා බුම්මාගෙන යන්න ගියා.



ඔහොම ටිකක් වෙලා ඉන්නකොට
පෙත්තප්පු එතනට ආවා.
පෙත්තප්පු චූටි බබා ළඟට
ඇවිත් සද්ද කළා.
චූටි බබා අහක බලාගෙන හිටියා.
ආයෙත් සද්ද කළා.
චූටි බබා ඇහුණේ නෑ වගේ හිටියා.



"මොකද මේ?" පෙත්තප්පු චූටි බබාගෙ කර උඩට පැනලා ඇහුවා.
"මිහ්, මිහ්, අපේ අම්ම, මිහ්!" චූටි බබා කියන්න හැදුවා.
"මිහ්, මිහ්, ඉතින් ඉතින්?" පෙත්තප්පු කීවා.

"පෙත්තප්පුට විහිළු. ඔයා නෙමෙයිනෙ බැණුම් ඇහුවෙ, මමනෙ."
චූටි බබාට පෙත්තප්පුටත් සැර දැම්මා.
"හරි, හරි, ඉතින් කියන්නකො මොකද වුණේ?" පෙත්තප්පු ඇහුවා.
"අපේ අම්මා වෙලාවකට හරි හොඳයි,
වෙලාවකට ---- හරි සැරයි!"
චූටි බබා කීවා.



"ම්-- ඒ මොකද?"
පෙත්තප්පු බෙල්ල සොලවමින් ඇහුවා.
"මම දන්නෙ නෑ පෙත්තප්පු. සමහර දවසට
වැඩ ඇරිලා එනකොට "මගේ චූටි පුතා---" කියලා
දුවලා ඇවිත් මාව වඩා ගන්නවා. සමහර දවසට
"යන්න ළමයො අහකට!" කියලා මට සැර කරනවා.
අදත් මට එහෙම සැර කළා."
චූටි බබා කට උල් කරමින් කීවා.

"හ්ම්---" පෙත්තප්පු ඔළුව නමාගෙන කල්පනා කළා.
"මට තේරෙන්නෙ නෑ පෙත්තප්පු, ඇයි අම්මා සැරින් සැරේ වෙනස් වෙන්නෙ කියලා. මම කැමතියි අම්මා හැමදාමත් මගේ චූටි පුතා කියලා දුවලා ඇවිත් මාව වඩා ගන්නවාට." චූටි බබා කීවා.
පෙත්තප්පු ඔළුව වනමින් අහගෙන හිටියා.



"ඇයි පෙත්තප්පු, අපේ අම්මට සමහර දවසට තරහ යන්නෙ?"
චූටි බබා ඇහුවා.
"ම්----සමහරවිට අම්මට උදේ ඉඳලාම වැඩ කරලා මහන්සිය නිසා තරහ ගියාද දන්නෙ නෑ. එහෙම නැත්නම් අම්මට කවුරු හරි බැන්නාද දන්නෙත් නෑ." පෙත්තප්පු කල්පනා කරමින් කීවා.
"ඉතින් මම නෙමෙයිනෙ බැන්නෙ. ඇයි අම්මා මට බැන්නෙ?"
චූටි බබා ඇහුවා.
පෙත්තප්පු ඔළුව කැසුවා.
"හරි, හරි, දැන් අපි යමු සෙල්ලම් කරන්න."
පෙත්තප්පු අඬගැහුවා.
"මට බෑ !" චූටි බබා කීවා.
"අනේ යමුකො සෙල්ලම් කරන්න."
පෙත්තප්පු චූටි බබාගෙ කමිසයෙන් ඇද්දා.
"මට බෑ කිව්වනෙ, යන්න අහකට!"
චූටි බබා කේන්තියෙන් සැර කළා.



"ඔන්න බලන්න! ඔයත් අම්මා වගේනෙ.
වෙලාවකට හරි හොඳයි, වෙලාවකට හරි සැරයි.
ඊයේ, අනේ අපි සෙල්ලම් කරමුකෝ කීවා.
අද, යන්න අහකට කියලා සැර කළා.
දැක්කා නේද ඔයාගෙත් හැටි. හ්ම්!"
පෙත්තප්පු මී අඹ ගහේ අත්තකට නැගලා
බුම්මාගත්තා.
චූටි බබාට හොඳටම ලැජ්ජා හිතුණා.



"දැන් තේරුණා නේද? අම්මා විතරක් නෙවෙයි ඔයත් එහෙමයි.
අපි හැමෝමත් එහෙමයි. එක එක වෙලාවට එක එක විධියයි.
දුකෙන් ඉන්නවා, සතුටෙන් ඉන්නවා, තරහින් ඉන්නවා,
හැම තිස්සෙම එක වගේ නෑ."
පෙත්තප්පු මී අඹ ගෙඩියකට හොටෙන් අනිමින් කීවා.

චූටි බබා ගෙදර දිහා බලාගෙන කල්පනා කළා.
"ඇත්ත තමයි. මටත් සමහර වෙලාවට කේන්ති යනවානෙ.
අනික් අයටත් එහෙම වෙනවා ඇති.
අම්මටත් අද මොනවාට හරි කේන්ති ගිහින් ඉන්න ඇති.
ඒ නිසා මම ඒකට තරහා වෙන්න හොඳ නෑ."
චූටි බබා ගෙදර දිහා බලාගෙන හිතුවා.



"චූටි බබා, දැන් හෙම්හිට ගෙදර ගිහින් බලන්න.
අම්මගේ කේන්තිය නිවිලා ඇති." පෙත්තප්පු කීවා.

චූටි බබා හෙමින් හෙමින් කුස්සිය පැත්තෙන් ගෙට ඇතුල් වුණා.
අම්මා කුස්සියේ තේ හදනවා.

චූටි බබා දැකලා අම්මා දුවලා ආවා.



"අනේ මගේ චූටි පුතා කොහෙද ගියේ ?"
අම්මා චූටි බබා වඩාගෙන තුරුල් කරගත්තා.
බබාට හරිම සතුටුයි.

"පෙත්තප්පු කීවේ ඇත්ත තමයි.
අපි හැමෝම වෙලාවකට හරි හොඳයි.
වෙලාවකට හරි -- සැ--ර--යි--!"

ඊට පස්සෙ චූටි බබා කවදාවත්
අම්මට කේන්ති ගියාට තරහ වුණේ නෑ.



